රණසිංහ, ආර්. එම්. ජී. කේ.

PAPER

**අතීත ශ්‍රී ලංකාවේ විහාරාරාම දේපළ පාලනය පිළිබඳ අධ්‍යයනයක්**
**(ප්‍රාථමික මූලාශ්‍රය ආශ්‍රයෙන්)**

ආර්. එම්. ජී. කේ. රණසිංහ, සමාජයීය විද්‍යා පීඨ පරිගණක මධ්‍යස්ථානය, කැලණිය විශ්වවිද්‍යාලය

මහින්දාගමනයත් සමඟින් බෞද්ධ රාජධානියක් වූ ශ්‍රී ලංකා සමාජයෙහි කැපී පෙනෙන ස්ථානයක් හිමිකර ගැනීමට භික්ෂු සමාජය සමත් විය. භික්ෂු- භික්ෂුණී සහ උපාසක- උපාසිකා යන සිව්වනක් පිරිස ම ලංකා සමාජයෙහි කැපී පෙනෙන චරිතයන් බවට පත් වූහ. මෙරට දේශපාලන අංශය මනා සැලසුමකින් යුක්තව ක්‍රියාත්මක වූ අතර ම එයට නොදෙවැනි තත්ත්වයක් භික්ෂු සමාජය තුළ ද දක්නට ලැබිණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ලංකාවේ මෙරට විහාරාරාම දේපළ පාලනය මනා සැලසුමකින් යුක්තව සිදු වූ බව අනුරාධපුර රාජධානි සමයෙන් හමු වන තොරතුරු තුළින් අනාවරණය කර ගත හැකිය.

මෙම පර්යේෂණයේ කාල පරාසය වශයෙන් යොදා ගනු ලැබුයේ දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ සිට අනුරාධපුර යුගය අවසානය දක්වා කාලය යි. දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ මෙරට බුදුදහම මුල් බැස ගැනීමෙන් පසුව අනුරාධපුර රාජධානිය බිඳ වැටීම දක්වා කාලය මෙහි දී අවධානයට යොමු වේ.

ඒ අනුව මෙම පර්යේෂණයෙහි ප්‍රධාන අරමුණ වනුයේ අනුරාධපුර සමාජයෙහි විහාරාරාම දේපළ පාලනය කෙසේ සිදු වූයේ ද? යන්න අධ්‍යයනය කිරීම යි. එයට අමතරව උප අරමුණු වශයෙන් විහාරාරාම දේපළ පාලනය උදෙසා දායකත්වය ලබාදුන්නෝ කවරහු ද? මෙන්ම ඔවුන්ට සමාජයේ කෙබඳු තත්ත්වයක් හිමි වූයේ ද? යන්න සම්බන්ධයෙන් අවධානය යොමු විය.

පර්යේෂණය සිදුකිරීමේ දී ක්‍රම වේදය වශයෙන් මහාවංසය, දීපවංසය, මහාවංසටීකාව හෙවත් වංසත්ථප්පකාසිනිය ඇතුළු ප්‍රාථමික මූලාශ්‍රයන් සහ ද්විතියික මූලාශ්‍රයන් පරිශීලනය විය.

එසේම රටේ වැදගත් සමාජ ස්ථරයක් වූ සංඝ සමාජයට වැදගත් ස්ථානයක් හිමි වූ බව පර්යේෂණයේ දී පැහැදිලි වේ. එමෙන් ම මෙම සමයේ විහාරාරාම දේපළ පාලනය උදෙසා වෙනම ම නිලධාරී පිරිසක් සිටි බව පර්යේෂණය අවසානයේ දී නිගමනය කළ හැකිය. අනුරාධපුර යුගයේ දී විහාරාරාම පාලනය ඉතා වැදගත් වූවක් බව පර්යේෂණයේ අවසාන නිගමනය වේ.